සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
நலன்புரி நன்மைகள் சபை
WELFARE BENEFITS BOARD
මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
Ministry of Finance, Economic Stabilaization & National Policies
මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No. | WBB/Notice/D.Div.2024 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2024.04. 17 |

WBB/Circular/No 09/2024

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් /
නියෝජ්‍ය සුබසාධක කොමසාරිස්වරුන් වෙත

**<u>අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ වැඩසටහනේ දෙවන අදියරේ නිවාස තොරතුරු සංගණන කටයුතු විධිමත්ව සිදු කිරීම</u>**

ඉහත වැඩසටහන යටතේ නිවාස තොරතුරු සංගණන කාර්යය සඳහා ඔබ විසින් ග්‍රාම නිලධාරි වසම් අනුව තෝරා ගන්නා ලද සංගණන නිලධාරින් එම කාර්යය සඳහා පුහුණු කිරීම් කටයුතු දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. දැනට දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කරමින් පවතින පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන යටතේ පුහුණුව ලැබූ පුහුණු කරන්නන් අදාළ සංගණන නිලධාරින් පුහුණු කරවීම සඳහා යොදවන ලෙස කාරුණිකව දන්වමි. මේ සඳහා පුහුණු වැඩසටහන් සකස් කර මූල්‍ය ප්‍රතිපාදන අවශ්‍යතාවයන් ඇස්තමේන්තු කර මා වෙත එවන මෙන් ද දන්වමි.

තවද තෝරා ගනු ලැබූ සංගණන නිලධාරින්ගේ නාම ලේඛනය මෙතෙක් අප වෙත එවා නොමැති නම් නොපමාව එය එවන ලෙස දන්වමි. එමෙන්ම අදාළ සංගණන නිලධාරින් සියළු දෙනා IWMS පද්ධතිය තුළ සංගණන නිලධාරින් වශයෙන් ලියාපදිංචි කරවීම හැකි ඉක්මනින් අවසන් කරන ලෙසද දන්වා සිටිමි.

දෙවන අදියරේ ලැබී ඇති අයදුම්පත්වල තොරතුරු පරිගණකගත කිරීම අවසන් කර නොමැති කාර්යාලවලට ඒ සඳහා 2024 04.19 දින දක්වා පමණක් කල් දෙනු ලැබේ. ඊට අදාළව සංගණන කටයුතු මැයි මස මුල සිට ආරම්භ කිරීමට නියමිත වේ. ඉන් අනතුරුව පළමු අදියරේ දත්ත නැවත සමාලෝචනය කිරීමේ වැඩපිළිවෙල යටතේ සංගණන කටයුතු ද ආරම්භ කිරීමට නියමිතව ඇත.

පළමු අදියරේ සංගණන ක්‍රියාවලිය තුළ පැවති විවිධ අඩුපාඩු හේතුවෙන් දත්ත පද්ධතියට ඇතුළත් කර ඇති දත්ත වල ගුණාත්මක භාවය පිළිබඳ යම් ගැටළු ඇති බව ඒ පිළිබඳ අධ්‍යනය කිරීමේදී පෙනී ගොස් ඇත. ඒ අතරින් ජංගම මෘදුකාංගය භාවිතා කර සංගණනය කිරීමේදී සංගණන නිලධාරියා අතින් සිදුවිය හැකි දෝශ අවම කර ගනිමින් ලබා ගන්නා දත්තවල ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා පහත සඳහන් වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරන ලෙස කාරුණිකව දන්වමි.

01. තෝරාගනු ලැබූ සංගණන නිලධාරින්ට සංගණනය ආරම්භ කිරීමට පෙර මනා පුහුණුවක් ලබාදීම. එම පුහුණුවට පහත සඳහන් කරුණුද අඩංගු කළ යුතුයි.
    I. ආදායම් උපයන්නන් හා යැපෙන්නන් මග නොහැරෙන සේ මෙන්ම එක් තැනැත්තෙක් පවුල් එකකට වැඩි ගණනකට ඇතුළත් නොවන සේ හා එක් පවුලක් පවුල් දෙකක් හෝ කිහිපයකට වෙන් නොවන සේ නිසි පරිදී පවුල හඳුනා ගෙන දත්ත ඇතුළත් කිරීමේ වැදගත්කම.
    II. අනිවාර්යයෙන් ඇතුළත් කළයුතු දත්ත සියල්ලම ඇතුළත් කරන බවට වග බලාගත යුතු බව.
    III. හැකි තරම් දත්ත වල නිරවද්‍යතාවය සනාථ කරගෙන ඇතුළත් කිරීමේ වැදගත්කම.


Tel: 009411-2151481
009411-2484600/4117
Fax: 009411-2151482
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / e-mail: welfarebenefitboard2016@gmail.com, info@iwms.wbb.gov.lk
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.wbb.gov.lk


Scanned with CamScanner

IV. අයදුම්කරුවන් විසින් අසත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම දඩුවම් ලැබිය හැකි වරදක් බව හා නිලධාරීන් විසින් හිතාමතාම දෝෂ සහිතව දත්ත ඇතුළත් කිරීම ද දඩුවම් ලැබිය හැකි වරදක් බව.

V. දෝශ සහිතව දත්ත ඇතුළත් කිරීම තුළින් සුදුස්සන් නොතේරීම හා නුසුදුස්සන් තේරීමට ඉඩකඩ ඇති බව.

VI. පළමු අදියරේදී ලැබූ අත්දැකීම් හුවමාරු කර ගැනීම හා ඒ තුළින් පාඩම් ඉගෙනීම.

02. සංගණන නිලධාරීන් කිහිප දෙනෙකුගේ කටයුතු සංගණනයට පෙර, සංගණනය අතරතුර සහ සංගණනයෙන් පසුව දත්ත පද්ධතියට ඇතුළත් කිරීම යන අවස්ථා තුනේදීම අධීක්ෂණය කර දත්තවල ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා සුපරීක්ෂකයින් අවශ්‍ය ප්‍රමාණයක් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සේවය කරන නිලධාරීන් අතරින් පත්කරගත යුතුයි. ඔවුන්ටද සංගණන නිලධාරීන් සමග පුහුණුවක් ලබාදිය යුතුයි.
අධීක්ෂණ වැඩපිළිවෙළ පිළිබඳව ඔවුන්ට අවශ්‍ය උපදෙස් දීම සඳහා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අනුයුක්ත සංඛ්‍යා ලේඛණ නිලධාරීන් යොදා ගන්නා මෙන් වැඩි දුරටත් දන්වමි.

03. සංගණන ක්‍රියාවලියේ සමස්ත අධීක්ෂණ හා මෙහෙයවීමේ කටයුතු ඇස්වැසුම ඒකකය භාර මාණ්ඩලික නිලධාරියා විසින් ඉටු කළ යුතුවේ. ලබා ගන්නා දත්ත පිළිබඳව විශ්ලේෂණය කිරීමක් ඉදිරියේදී සිදු කිරීමට නියමිත බැවින් තම කොට්ඨාසයේ දත්ත සංගණන කටයුතු වල ගුණාත්මක භාවය ඉහළින් තබා ගැනීම ප්‍රාදේශිය ලේකම්වරුන්ගේ වගකීමක් සේ සැලකිය යුතුයි.

ප්‍රතිලාභ සඳහා සුදුස්සන් තේරීමේදී යම් යම් විෂමතා සිදුවීම අවම කිරීම සඳහා ඉහත උපදෙස් පරිදි ක්‍රියා කිරීම තුළින් ඉහළ ගුණාත්මක භාවයකින් දත්ත ලබා ගැනීම බෙහෙවින් ඉවහල් වනු ඇත. තවද දත්ත ලබා ගැනීම සඳහා භාවිතා කරනු ලබන ජංගම මෘදුකාංගයෙහි අඩුපාඩු නිවැරදි කර එය වැඩි දියුණු කිරීම සඳහා දැනට පියවර ගෙන ඇත. තෝරා ගැනීමේ නිර්ණායක හෝ බර තැබීම් ක්‍රමවේදය සංශෝධනය කළ යුතු ආකාරය පිළිබඳව තාක්ෂණික කමිටුවක් මගින් දැනට අධ්‍යනය කරමින් පවතින අතර එහි ප්‍රතිඵළ මත ඉදිරියේදී අවශ්‍ය සංශෝධන සිදුවනු ඇති බව කාරුණිකව සලකන්න.

ජයන්ත විජේරත්න
සභාපති/කොමසාරිස්

පිටපත් -අධ්‍යක්ෂ ජනරාල් ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
- සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/අතිරේක සුබසාධක ප්‍රතිලාභ කොමසාරිස්වරුන්- කා.දැ.පි.

Scanned with CamScanner